ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව - 2015

--------------------------------------

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

## 2.1 මතය ව්‍යාචනය

----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

-------------------------

සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන සී/ස ලංකා සිමෙන්ති සමාගමේ කොටස් හිමිකමෙන් සියයට 62.45 ක් සංස්ථාව සතු වුවද, 2015 වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

-------------------------------------

(අ) සංස්ථාව ප්‍රතිව්‍යුහගතකරණයට ලක් කිරීම හේතුවෙන් වත්කම් ප්‍රත්‍යාගණනය අවශ්‍ය වුවත්, පිරිවැය රු.15,392,480 ක් වූ වාහන 08 ක් ප්‍රත්‍යාගණනය කර වර්තමාන වෙළඳපල අගයට ගලපා නොතිබුණි.

(ආ) ගැසට් පත්‍ර මඟින් 1964 හා 1977 වර්ෂ වලදී සංස්ථාවට පවරන ලද අක්කර 5718 ක පිහිටි ඉඩම්, ගොඩනැගිලි සහ කර්මාන්ත ශාලාව තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය බැංකුවක ණය ගිණුම් 2 ක හා බැංකු ජංගම ගිණුමක් සඳහා බැංකුවෙන් එවන ලද ශේෂ සනාථ කිරීම් අනුව බැංකු ණය පොළී හා අයිරා පොළී එකතුව රු.6,805,093 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එම ණය පොළී සහ අයිරා පොළිය රු.15,271,328 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් බැංකු ණය පොළිය සහ අයිරා පොළිය රු.8,466,235 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ජර්නල් සටහන් 02 ක් මඟින් රඳවාගත් ඉපැයීම් ගිණුමට හර හා බැර කල යුතු පිළිවෙලින් රු.3,388,010 ක් හා රු.19,752,464 ක් එම ගිණුමේ සටහන් නොකිරීම හා සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.1,728,000 ක් වූ ලාභාංශ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගලපා නොතිබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල තුල්‍යතාවය විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ඇ) මන්නාරම් දිස්ත්‍රික්කයේ පුලියාඩි ඉරක්කම් හි පිහිටි අක්කර 604 ක මැටි සහ හුණුගල් නිධිය සහිත ඉඩම දිගුකාලීන බදු පදනම මත සංස්ථාව වෙත ලබාදී ඇතත්, ඉඩමේ අයිතිය තහවුරු කරගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක හා අවසාන ගෙවිය යුතු වෙළඳ ගෙවීම්වල වැඩිවීම රු.24,814,414 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ, මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය තුළ කාරක ප්‍රාග්ධනයේ වෙනස ගැලපීමේදී, එම වැඩිවීම රු.11,226,932 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) දිගුකාලීන හා කෙටිකාලීන ණය ලබා ගැනීම් හා ණය ආපසු ගෙවීම් වල ශුද්ධ අගය රු.4,580,014 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම්වල එම ශුද්ධ අගය රු.1,819,094 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2015 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල්වලට සමාන දෑ වල වටිනාකම රු.19,909,145 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු.29,408,442 ක් ලෙස දක්වා තිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.516,185 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) පරිගණක වැඩසටහනක් මඟින් පිළියෙල කර, සංස්ථාවේ ලෙජරය විගණනයට ඉදිරිපත් කර තිබුණි. නමුත් එම ලෙජරයේ තිබූ රඳවා ගත් ඉපැයුම් ගිණුම එම වැඩසටහන මඟින් සකස් නොකර, එම ලෙජර් ගිණුමේ සටහන් වෙනම යතුරුලියනය කර, ලෙජර් ගිණුම මත අලවා තිබීම හේතුවෙන් විගණනයට ඉදිරිපත්කළ ලෙජර් ගිණුමේ නිරවද්‍යතාව පිළිගැනීමට නොහැකි විය.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලෙජර් ගිණුම අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට විවිධ අත්තිකාරම් ශේෂය රු.245,946 ක් වූ අතර, විගණනයට ඉදිරිපත්කළ අත්තිකාරම් ලේඛනය අනුව එම ශේෂය රු.116,336 ක් වූයෙන් රු.129,610 ක වෙනසක් පැවතුණි.

(ආ) සංස්ථාවේ ලෙජර් ගිණුම් 04 ක ඉකුත් වර්ෂ අවසාන ගිණුම් ශේෂ සහ ආරම්භක ශේෂ අතර රු.3,770,794 ක වෙනස්කම් පැවතුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ රඳවා ගත් ඉපැයීම් වටිනාකම රු.337,660,694 ක් වූ අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම වටිනාකම රු.337,313,622 ක් ලෙස දක්වා තිබීම නිසා රු.347,072 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක 2015 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂය රු.148,061 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම ශේෂය රු.1,696,150 ක් ලෙස රු.1,548,089 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය රු.80,551,270 ක් වූ අතර එයින් වසරකට අඩු වූ ණය ශේෂ රු.8,245,359 ක්ද, වසර 1 සිට වසර 3 දක්වා වූ ණය ශේෂ රු.14,323,896 ක් ද, වසර 3 ට වැඩි පැරණි ණය ශේෂ රු.57,982,015 ක් ද විය. මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු බැරකම් ශේෂය රු.93,330,134 ක් වූ අතර, එයින් වසරකට අඩු වූ ණය ශේෂ රු.41,640,831 ක්ද, වසර 1 සිට වසර 3 දක්වා වූ ණය ශේෂ රු.22,459,105 ක් ද, වසර 3 ට වැඩි පැරණි ණය ශේෂ රු.29,230,198 ක් ද විය. මෙම ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**---------------------------------**

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනුවල නිවැරදිතාවය විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 775,295,981 | ස්ථාවර වත්කම් ලේඛන |
| මෝටර් රථ | 15,392,480 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලී බඩු හා සවි කිරීම් | 5,512,601 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| උපකරණ හා සන්නිවේදන උපකරණ | 1,194,398 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| අවසන් තොගය | | |
| කොන්ක්‍රීට් නිෂ්පාදනය | 6,104,684 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| යාපනය - සිමෙන්ති තොගය | 501,461 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| දිගුකාලීන ණය | 56,293,352 | ශේෂ සනාථ කිරීමේ ලිපි |

**2.2.7 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 4 වගන්තිය | දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු රු.11,548,263 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371 (2) | ලබාගත් අත්තිකාරම් අදාල කාර්යය නිමවූ විගස පියවිය යුතු වුවත්, එකතුව රු.83,836 ක් වූ අත්තිකාරම් වර්ෂ 2 සිට වර්ෂ 3 දක්වා වූ කාලයක සිට පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් මාස 06 ඉක්මවූ එකතුව රු.390,485 ක් වටිනා චෙක්පත් දෙකක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 751 | ආයතනය ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 756 (1) | 2015 වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (v) මුදල් රෙගුලාසි 757(4) | මුදල් වර්ෂය අවසන් වූ වහාම තම වත්කම් පිළිබඳව සමීක්ෂණයක් පවත්වා එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ

| | |
|---|---|
| (i) 5.1.3 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන පිටපත් අයවැය ලේඛනය සමඟ රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 8.3.9 වගන්තිය | රාජ්‍ය සංස්ථා, මණ්ඩලවල සම්පත් රේඛීය අමාත්‍යාංශයේ කටයුතු සඳහා ලබා නොදිය යුතු වුවත්, 2011 ජනවාරි මාසයේදී රු. මිලියන 4.8 කට සංස්ථාව විසින් මිලදී ගත් කැබ් රථය මිලදී ගත් දින සිට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණි. |
| (ඈ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 වගන්තිය | ධාවනයෙන් ඉවත් කර තිබූ මෝටර් රථ දෙකක් අපහරණය කිරීමට කටයුතු නොකර ගර්හිත තත්ත්වයේ පැවතුණි. |

### 2.2.8 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 සහ 2015 වර්ෂ වලදී විනෝද චාරිකාවක් සඳහා රු.1,100,000 ක මුදලක් නිසි අනුමැතියකින් තොරව සංස්ථාවේ නිළධාරින්ට ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව විසින් ජ්නල් වවුචර් 74 ක් පිළියෙල කර තිබුණද එම ජ්නල් වවුචර්වලින් 73 ක් අනුමත කර නොතිබුණි.

(ඇ) ගැසට් නිවේදනයක් මඟින් සංස්ථාව වෙත පවරා තිබූ පුත්තලම පාලවි හි පිහිටි අක්කර 221 ක ඉඩමෙන් අක්කර 50 ක ප්‍රමාණයක් විධිමත් අනුමැතියකින් තොරව 2005 වර්ෂයේදී ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් සඳහා පවරා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,344,849 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.13,792,672 ක ඌනතාවයක් වූයෙන් ඉතුක් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.18,137,521 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ රු. 19,752,464 ක්වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ තුනක් කපා හැරීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී රු.2,600,000 ක ශුද්ධ ලාභයක් පැවතියද, 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩව ශුද්ධ අලාභ ලබා නැවතත් 2015 වර්ෂය වනවිට රු.4,344,849 ක ශුද්ධ ලාභ තත්ත්වයක් ඇතිවී තිබුණි. සේවක පාරිශ්‍රමිකය, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී සංස්ථාවේ දායකත්වය, 2011 වර්ෂයේදී රු.33,720,000 ක ධන අගයක් වූ අතර 2012 හා 2013 වර්ෂ වලදී සෘණ අගයක් ගෙන තිබුණි. නැවතත් 2015 වර්ෂයේද රු.38,344,849 ක ධන අගයක් බවට වර්ධනය වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 58 කින් වැඩි වී තිබුණු අතර, ක්ෂණික අනුපාතයද සියයට 87 කින් වැඩි වී තිබුණි. ජංගම වත්කම්වලට වඩා රු.113,564,793 කින් ජංගම වගකීම් වැඩිවීම හේතුවෙන් ජංගම වගකීම් පියවා ගැනීමට තරම්, ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් නොපවතින බැවින්, සංස්ථාවේ ද්‍රවශීලතාවය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂයේ රු.285,657,759 ක් වූ විකුණුම් ආදායම සමාලෝචිත වර්ෂයේ රු.40,570,803 ක් දක්වා රු.245,086,956 කින් අඩු වී තිබුණි. මෙසේ විකුණුම් ආදායම අඩුවීමට ප්‍රධාන වශයෙන් 2014 දෙසැම්බර් මාසයෙන් පසු 2015 ජූලි මාසය දක්වා මූල්‍ය දුෂ්කරතා මත සිමෙන්ති ආනයනය කිරීමට නොහැකි වීමත්, සිමෙන්ති ණය පදනම මත අලෙවිය සම්පූර්ණයෙන් නතර කර රාජ්‍ය ආයතනවල සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වී එම ඇණවුම් මත අලෙවිය සිදු කිරීමත් හේතුවී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී රු.4,779,245 ක් වූ දළ ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.10,210,679 ක දළ අලාභයක් වී තිබුණි. දළ අලාභයක් ලැබීමට ප්‍රධාන වශයෙන් සිමෙන්ති නිෂ්පාදන අංශයේ සෘජු පිරිවැය ඉහළ මට්ටමක තිබියදී විකුණුම් විශාල වශයෙන් අඩුවීම බලපා තිබුණි. එසේ දළ අලාභයක් ලබා තිබුණද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත කරන ලද පූර්ව වර්ෂ ගැලපීම් රු.16,364,454 ක් අනෙකුත් ආදායම් යටතේ දැක්වීම මඟින් රු.4,344,849 ක ශුද්ධ ලාභයක් ලබා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1959 ජනවාරි 2 දිනැති අංක 11634 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව සිමෙන්ති නිෂ්පාදනය ආනයනය කිරීම හා අලෙවි කිරීම, සිමෙන්තියෙන් නිෂ්පාදිත භාණ්ඩ අලෙවිය හෝ සිමෙන්ති

කොන්ක්‍රීට් ඇතුළත් දුරකථන සහ විදුලි පණිවුඩ කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය කිරීම, ඕනෑම පුද්ගලයෙකුට විද්‍යුත් බලශක්තිය තොග වශයෙන් සැපයීම සංස්ථාවේ ප්‍රධාන අරමුණු විය.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිමෙන්ති නිෂ්පාදනය කර අලෙවි කිරීම සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන සංස්ථාවේ ප්‍රධාන අරමුණු වුවත්, පසුගිය යුධමය වාතාවරණය තුළ කන්කසන්තුරේ සිමෙන්ති නිෂ්පාදනය නතර වීමත් සමඟ, වර්තමානය වන විට සිමෙන්ති බෑග් ආනයනය කර අලෙවි කිරීම සහ කොන්ක්‍රීට් නිෂ්පාදන අලෙවිය දක්වා ආයතනයේ මූලික කාර්යය සීමා වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සමඟ කාර්ය සාධන වාර්තාව සැසඳීමේදී සත්‍ය ක්‍රියාකාරීත්වය සන්සන්දනය කළ හැකි පරිදි එම වාර්තාව පිළියෙල කර නොතිබුණි.

(ඇ) සංයුක්ත සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළදී රු.574,892,000 ක් වටිනා සිමෙන්ති අලෙවි කිරීමට සැලසුම් කර තිබුණද, කාර්යසාධන වාර්තාව අනුව අලෙවි කර තිබුණේ රු.42,060,062 ක් වටිනා සිමෙන්ති පමණි. ඒ අනුව ලඟාකරගත් කාර්ය සාධනය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 7.3 ක් විය.

(ඈ) කොන්ක්‍රීට් කණු ආශ්‍රිත නිෂ්පාදන මත රු.12,000,000 ක ඉලක්කගත ආදායමක් ලබා ගැනීමට සැලසුම්කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු.1,026,147 ක ආදායමක් පමණක් ලබා කර ගැනීම නිසා ලඟා කරගත් කාර්යසාධනය අපේක්ෂිත ඉලක්ක ගත ආදායමින් සියයට 8.6 ක් විය.

(ඉ) කන්කසන්තුරේ කොන්ක්‍රීට් නිෂ්පාදන සහ අලෙවි අංශයේ මුළු ආදායමට වඩා වියදම් දැරීමට සිදු වීම නිසා දිගින් දිගටම අලාභ ලබා තිබූ අතර, පසුගිය වසර නවයක කාලය තුළ ලබා තිබූ අලාභයන් පරීක්ෂා කිරීමේදී රු.30,298 සිට රු.19,526,633 ක් දක්වා පරාසයක අලාභයක් ලබා තිබුණි.

(ඊ) සංයුක්ත සැලැස්මේ ඉලක්කගත ආදායම් හා වියදම් සමාලෝචනය කර ඒවා සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබූ අතර, සංයුක්ත සැලැස්මේ සමාලෝචිත වර්ෂය සඳහා මුළු ඉලක්කගත අලෙවි ආදායම රු.613,662,000 ක් වුවද, ලඟා කරගත් සත්‍ය ආදායම රු.67,235,628 කි. ඒ අනුව ලඟා කරගෙන තිබුණේ ඉලක්කගත ආදායමෙන් සියයට 11 ක් පමණි. 2014 වසරට සාපේක්ෂව 2015 වර්ෂයේදී සිමෙන්ති ආනයනය මෙට්‍රික් ටොන් 17,500 කින් අඩුවීම නිසා, රු. මිලියන 245.08 කින් අලෙවි ආදායම අඩු වී තිබුණි.

(උ) 2015 ක්‍රියාකාරී සැලැස්ම අනුව මුතුරාජවෙල නව සිමෙන්ති ඇසුරුම් කර්මාන්තශාලාව පිහිටුවීම යටතේ, ආනයනිත සිමෙන්ති තොග ඇසුරුම් කර අලෙවි කිරීමෙන් රු.මිලියන 2,055 ක විකුණුම් පිරිවැටුමක් සහ මෙට්‍රික් ටොන් මිලියන 148,500 ක නිෂ්පාදන ධාරිතාවයක් ඉලක්ක කර තිබුණි. සංයුක්ත සැලැස්මේ එම අරමුණු ඇතුළත් කර නොතිබූ අතර, වර්ෂය අවසානයේදී අපේක්ෂිත ඉලක්ක කිසිවක් අත්පත් කර ගැනීමට සැලැස්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් අක්කර 5352 ක් වූ අරුවක්කාලු පිහිටි හුණුගල් නිධිය 1995 වර්ෂයේදී සිමෙන්ති නිෂ්පාදනය සඳහා හුණුගල් කැණීම් කර ගැනීමට පෞද්ගලික සමාගමකට වසර 50 ක කාල සීමාවකට බදු දී තිබුණි. බදු ගිවිසුම අනුව අයකරගත යුතු වාර්ෂික කුලිය වූ ඇ.ඩො 202,000 කට සමාන වටිනාකම සමාලෝචිත වර්ෂය සඳහා රු.26,664,825 ක් විය. කෙසේ නමුත්, ඇතිකරගෙන තිබූ බදු ගිවිසුමේ වාර්ෂික බදු කුලිය සංශෝධනය කිරීම පිළිබඳ වගන්තියක් ඇතුළත් කර නොතිබීම හේතුවෙන් 2011 අගෝස්තු 16 දින පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙම බදු ගිවිසුම සංශෝධනය කිරීමට උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්ථාවට අයත් මන්නාරම් දිස්ත්‍රික්කයේ පුලියාඩි ඉරක්කම්වල පිහිටි අක්කර 604 ක ඉඩමෙන් අක්කර 10 ක ප්‍රමාණයක් නාත්තන් දිස්ත්‍රික් ලේකම් විසින් අවතැන් වූ පවුල් පදිංචි කිරීම සඳහා ලබා දී තිබුණි. මෙම අනවසර පදිංචි කිරීම් පිළිබඳ සොයා බලා ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1967 ජුලි 12 දිනැති අංක 14756/7 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් සංස්ථාවට හිමි වී ඇති පර්චස් 89.9 ක කොල්ලුපිටියේ පිහිටි ඉඩම, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර සමාලෝචන කමිටුවේ නිර්දේශ අනුව විදේශීය ආයෝජකයෙකු වෙත දීර්ඝකාලීනව බදු දීමට කටයුතු කරමින් සිටින බව මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් දක්වා තිබුණද, ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේදී මෙම දීර්ඝකාලීනව බදු දීමට අදාළව කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ගාල්ල උණවටුන කැස්බෑපාන පිහිටි අක්කර 6 ක් පමණ වන ඉඩමෙහි සුනාමියෙන් විපතට පත් වූවන් සඳහා නිවාස ඉදි කර පදිංචි කර තිබුණි. සංස්ථාවට අයත් මෙම ඉඩමේ හිමිකම් නිරවුල් කර ගැනීමට හෝ වන්දි මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පුත්තලම පාලම් හි පිහිටි ඉඩමෙන් අක්කර 09 ක ඉඩම් කොටසක අනවසර පදිංචිකරුවන් විසින් නිවාස ඉදි කර පදිංචි වී තිබුණි. මේ පිළිබඳව සොයා බලා ඉඩම් හිමිකාරිත්වය නිරවුල් කර ගැනීමට කළමනාකාරිත්වය පියවර ගෙන නොතිබුණි.

### 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

තක්සේරුකර වටිනාකම ගිණුම්ගත නොකළ සංස්ථාවට අයත් කන්කසන්තුරේ පිහිටි අක්කර 741 ක් වූ කර්මාන්තශාලාව සහිත ඉඩම සහ රු.395,000 ක් වටිනා ගොඩනැගිලි සංකීර්ණය අධි ආරක්ෂිත කලාපයේ යුධ හමුදාව භාරයේ දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

### 4.4 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1981 වර්ෂයේදී ආරම්භ කරන ලද සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වලින් සියයට 62.45 ක හිමිකාරිත්වයක් සංස්ථාව සතු වුවද, එම ආයෝජනය සඳහා පසුගිය වසර 25 ක කාලය තුළ කිසිඳු ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලබා දී නොතිබුණි.

(ආ) අන්තර්ජාතික සමාගමකට වන්දි ගෙවීම සඳහා 2012 වර්ෂයේදී රාජ්‍ය බැංකුවකින් ලබාගත් රු.38,704,668 ක් වූ බැංකු ණය සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට එකතුව රු.10,066,774 ක ණය පොළී ගෙවා තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අනුමත කාර්යය මණ්ඩලය 76 ක් හා තත්‍ය කාර්යය මණ්ඩලය 53 ක් වූ අතර තනතුරු 23 ක පුරප්පාඩු පැවතුණි. මෙම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් අභ්‍යන්තර පාලනය, වැඩ බෙදීම, අභ්‍යන්තර පරීක්ෂාවන් හා අභ්‍යන්තර විගණන කාර්යයන් කාර්යක්ෂමව ඉටු නොවන බව නිරීක්ෂණය විය.

(ආ) මූලික සුදුසුකම් සපුරා නොමැති නිලධාරියෙකු 2012 වර්ෂයේදී විකුණුම් සහ අලෙවි නිලධාරී ලෙස බඳවාගෙන තිබූ අතර ඔහු විසින් අනුමත ණය සීමාව ඉක්මවා සිමෙන්ති ණය පදනම මත නිකුත් කිරීම හේතුවෙන් රු. මිලියන 6 කට අධික මූල්‍ය පාඩුවක් සිදු වී තිබුණි. ඒ හේතුවෙන් 2015 නොවැම්බර් 04 දින සිට ඔහුගේ සේවය අවසන් කර තිබූ අතර සංස්ථාවට සිදු වූ අලාභය අයකර ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර තිබුණද, එම අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 නොවැම්බර් 04 දින සිට පුරප්පාඩු වී පවතින විකුණුම් හා අලෙවි නිලධාරී තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂ 5 තුළ මුළු සේවක සංඛ්‍යාව අඩු වී තිබියදී මුළු සේවක පිරිවැය 2011 වර්ෂයේ දී රු.24,410,000 ක සිට 2015 වර්ෂය වන විට රු.29,840,000 ක් දක්වා රු.5,430,000 කින් ඉහළ ගොස් තිබුණි. ඒ අනුව එක් සේවක සාමාන්‍ය පිරිවැය 2011 වර්ෂයේදී රු.358,970 ක සිට 2015 වර්ෂය වන විට රු.563,018 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සිමෙන්ති සංස්ථාවේ 2015 වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකශන 2016 දෙසැම්බර් 31 දින දක්වා විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව සැලසුම්ගත කාලපරිච්ඡේදය තුළදී සපුරාගත යුතු අරමුණු හා ඉලක්ක පිළිබඳව කළමණාකරුවන්ගේ වගකීම ක්‍රියාකාරී සැලැස්මේ පැහැදිලිව දක්වා නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 වගන්තිය ප්‍රකාරව මාස තුනකට වරක් කාර්යසාධන වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර නොතිබුණු අතර, කාර්තුව අවසන් වී දින 30 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සංස්ථාව විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණන සැලැස්ම අනුව ආවරණය කල යුතු ක්ෂේත්‍ර දක්වා තිබුණද, ඊට අනුකූලව විගණන කටයුතු සිදු කර නොතිබුණු අතර, ප්‍රධාන වශයෙන් භෞතික තොග ගණනය කිරීම සඳහා විගණන කටයුතු සීමා වී තිබුණි.

(ආ) සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය සඳහා එක් නිලධාරිනියක් පමණක් අනුයුක්ත කර තිබුණු අතර, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු විධිමත් ලෙස පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි.

## 5.4 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් මාස තුනකට වරක් විගණන කමිටු පැවැත්විය යුතු වුවත්, සංස්ථාව විසින් 2015 වර්ෂය තුළදී විගණන කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

ණය පදනම මත සිමෙන්ති විකිණීම සඳහා අළෙවි නියෝජිත ධූරය ප්‍රදානය කිරිමේදී ණයට ලබාදෙන වටිනාකමට සරිලන ඇප බැදුම්කරයක් ලබා නොගැනීම, ණය විය හැකි උපරිම ප්‍රමාණයන් ගිවිසුමේ සඳහන් නොකිරීම, ණය ගෙවීම පැහැර හරින්නන්ගෙන් ණය අයකර ගන්නා ක්‍රමවේදය ගිවිසුමට ඇතුළත් නොකිරීම, ණය ගෙවීමට අපොහොසත්ව තිබියදී නැවත නැවතත් ණයට සැපයීම, බැංකු ඇපකර සඳහා ව්‍යාජ තොරතුරු ලබා දීම, අවිධිමත් පරිදි ණය අනුමත කරන ලද නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග නොගැනීම හා අයවිය යුතු ණය ශේෂ පිළිබඳ පසු විපරම් නොකිරීම වැනි අඩු පාඩු පසුගිය විගණන වාර්තාවෙන්ද පෙන්වා දී ඇතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් රු.52,506,824 ක් වූ මුළු ණය ශේෂය අය කරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලද අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | විධිමත් මූල්‍ය පාලන ක්‍රම හඳුන්වා නොදීම, බදු සහ බැංකු ණය වැනි අත්‍යාවශ්‍ය ගෙවීම් සිදු නොකිරීම, බැංකු අයිරා පවත්වා ගැනීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම සහ සමීක්ෂණ මණ්ඩල පත්කර වත්කම් සමීක්ෂණය අවසන් නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) | ගබඩා පාලනය | තොග නඩත්තු කිරීම, තොග ලේඛන සහ පොත්පත් පවත්වාගෙන යාම, තොග හානි සහ ප්‍රමාද ගාස්තු අවම කර ගත යුතු වීම. |
| (ඇ) | ණයගැති හා ණයහිමි පාලනය | ආයතනයට ඇති අයවිය යුතු ණය ශේෂ අයකර නොගැනීම, ණය අලෙවියට අදාළ වාර්තා නිසි පරිදි නඩත්තු නොකිරීම සහ ණයහිමියන්ට ගෙවා නිරවුල් නොකිරීම. |